## අධ්‍යාපනය

නිදහස ලැබීමෙන් පසු ව ක්‍රියාත්මක කළ අධ්‍යාපන ප්‍රතිපත්තිය 1931-1947 දක්වා අධ්‍යාපන ඇමති ධූරය දැරූ ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතාගේ පුරෝගාමීත්වයෙන් සම්පාදනය කොට තිබිණි. ඒ පිළිබඳ වැඩි විස්තර දෙවැනි පරිච්ඡේදයෙන් කියවා ගත හැකි ය.

එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ නායකත්වයෙන් 1956 දී බලයට පත් වූ මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව, අධ්‍යාපනය දියුණු කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට ඇත. ඒ අනුව,

- අධ්‍යාපනය ස්වභාෂාවෙන් ලබා දීම,
- අතරමඟ නැවතී තිබූ දිවා ආහාරය ලබා දීමේ වැඩ පිළිවෙළ නැවත ක්‍රියාත්මක කිරීම,
- දිළිඳු දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රමානුකූල ව ක්‍රියාත්මක කිරීම,
- සෑම මහ විදුහලකට ම විද්‍යාගාරයක් බැගින් ලබා දීම,
- උසස් අධ්‍යාපනය නඟා සිටුවීම සඳහා 1958 - විද්‍යෝදය සහ විද්‍යාලංකාර පිරිවෙන් විශ්වවිද්‍යාල තත්ත්වයකට පත් කිරීම යනාදිය 1956 බලයට පත් වූ මහජන එක්සත් පෙරමුණු රජය ක්‍රියාත්මක කළ වැඩපිළිවෙළෙහි, කැපී පෙනෙන අංග කිහිපයකි.
- 1962 දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ පාලන සමයේ උපකෘත පාසල් රජයට පවරා ගැනීම සිදු විය.
- විශාල වශයෙන් ගාස්තු අය කොට විවිධ මිෂනාරි සමාගම් මඟින් පවත්වාගෙන ගිය, පුද්ගලික පාසල් රජයට පවරා ගැනීම නිසා විශාල පිරිසකට අධ්‍යාපනය නොමිලේ ලබා ගැනීමේ අවස්ථා උදා විය.
- සියලු ම උපකෘත ගුරු විද්‍යාල ද රජයට පවරා ගනු ලැබී ය.
- සියලු ම ගුරු විද්‍යාලවල ඉංග්‍රීසි පාඨමාලා අනිවාර්ය කරනු ලැබී ය.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ ව කොළඹ විශ්ව විද්‍යාලයේ කලා මණ්ඩපය ද පිහිටු විය.
- පාසල් අධ්‍යාපනය නංවාලීමේ අරමුණින් 1963 - 65 ශිෂ්‍ය ගුරුවිභාගය පවත්වා එමඟින් තෝරා ගත් ගුරුභවතුන් රජයේ පාසල්වල සේවයේ යොදවනු ලැබී ය.
- ඒ අතර දිස්ත්‍රික්ක පදනම මත ගුරුසේවය ප්‍රතිසංවිධානය කිරීමට පියවර ගනු ලැබී ය.
- ඊට අමතර ව ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් පත් කිරීම සිදුවී ය.

- **1960 - 1970 අතර කාලයේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා රාශියක් ඇති විය.**
- 1960 උසස් අධ්‍යාපන පනත මගින් අධ්‍යාපන පරිපාලන රටාව වෙනස් කරන ලදී.
- කනිෂ්ඨ විශ්වවිද්‍යාල ආරම්භ කෙරිණි.
- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව හා සම්බන්ධ කොට මුද්‍රණාලයක් පිහිටු වනු ලැබිණි.
- ශ්‍රමාභිමානී සති සහ වැඩ හුරුව වැඩසටහන් පාසල් සිසුන්ට හඳුන්වා දෙන ලදී.
- කොළඹ විශ්වවිද්‍යාල මණ්ඩපය ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට පත් කෙරිණි.
- 1968 වර්ෂයේ දී විෂයමාලා සංවර්ධන මධ්‍යස්ථානය ආරම්භ කරනු ලැබී ය.
- ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පිහිටු වනු ලැබිණි.
- භික්ෂූන් වහන්සේලා සඳහා වෙන ම විශ්වවිද්‍යාලයක් වූ බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය ආරම්භ කෙරිණි.

## උසස් අධ්‍යාපනය

- බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ම ලන්ඩන් විශ්වවිද්‍යාලයට අනුබද්ධ කොට 1921 සිට පිහිටුවා තිබූ "යුනිවර්සිටි කොලීජිය" වෙනුවට 1942 දී ලංකා විශ්වවිද්‍යාලය කොළඹ පිහිටු විය.
- ලංකා විශ්වවිද්‍යාලය 1952 දී පේරාදෙණියට ගෙන යන ලදී. එහි කලා හා ප්‍රාචීන භාෂා පීඨ පිහිටුවනු ලැබිණි.
- 1960 පේරාදෙණියේ වෛද්‍ය හා ඉංජිනේරු පීඨ ද ආරම්භ කෙරිණි.
- විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය කැලණිය විශ්වවිද්‍යාලය නමින් ද විද්‍යෝදය විශ්වවිද්‍යාලය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය නමින් ද හැඳින්වීම 1966 දී ආරම්භ විය.
- 1972 කටුබැද්ද විශ්වවිද්‍යාලය ආරම්භ වූ අතර 1974 යාපන විශ්වවිද්‍යාලය පිහිටුවනු ලැබිණි. මෙලෙස නිදහස ලැබීමෙන් පසු උසස් අධ්‍යාපනය ක්‍රමයෙන් වර්ධනය විය.



රූපය 6.11 පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## කෘෂිකර්මය

අතීතයේ රජරට රාජධානි පැවති අවධියේ ශ්‍රී ලාංකිකයෝ සරල ස්වයංපෝෂිත ආර්ථික රටාවකට අනුව ජීවත් වූහ. කාලිංග මාඝගේ ආක්‍රමණය සමඟ තෙත් කලාපයට ඇදී ගිය ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන රටාව ක්‍රමික වෙනසකට භාජනය වූ ආකාරය අපි දහවන ශ්‍රේණියේ දී ඉගෙන ගත්තෙමු.

16 වන සියවසේ බටහිර ජාතීන්ගේ පැමිණීම හා 1815 බ්‍රිතාන්‍යයන් මෙම දිවයින පුරා තම අණසක පතුරුවා හැරීම හේතු කොට ගෙන ශ්‍රී ලංකාවේ ආර්ථිකය නව මඟකට යොමු වූ ආකාරය ද අපි මෙහි දෙවැනි පරිච්ඡේදයෙන් උගත්තෙමු.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම**

"සරල ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය" විස්තර කරන්න.

යැපුම් කෘෂිකර්මයෙන් තම දිවිපෙවෙත සරු කොට ගත් ශ්‍රී ලාංකිකයෝ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය අවශ්‍යතා මත වාණිජ කෘෂි ද්‍රව්‍ය නිපදවන්නන් බවට පත් වූහ. එහි ප්‍රතිඵලයක් ලෙස 1948 ශ්‍රී ලංකාව නිදහස ලබා ගත් අවධිය වන විට මෙරට ජනතාව ඔවුන්ට අවශ්‍ය ආහාර විදේශිකයන්ගෙන් ආනයනය කරන්නා වූ ද විදේශීය වෙළෙඳපොළට අමු ද්‍රව්‍ය නිපදවන්නා වූ ද පිරිසක් බවට පත් වී සිටියහ.

දෙවන ලෝක සංග්‍රාමය පැවති අවධියේ ආහාර ආනයනයට බාධා ඇති වීමත් සමඟ මේ රටේ ජනතාවට බෙහෙවින් අමිහිරි වේදනාවලට මුහුණ දෙන්නට සිදු විය. එයින් පීඩාවට පත් වූ ජනතාව හා දේශීය නායකයෝ මෙරටට උරුම ව පැවති යැපුම් කෘෂිකර්මය දියුණු කිරීමේ අවශ්‍යතාව වටහා ගත්හ.

නිදහසින් පසු බලයට පත් සෑම රජයක් ම පාහේ සහලින් රට ස්වයංපෝෂිත කිරීම අරමුණ කොට ගෙන විවිධ ක්‍රියා මාර්ග අනුගමනය කරනු දක්නට ලැබේ.

## වී වගාව දියුණු කිරීමට ගත් විධිවිධාන

ගොවිජන සේවා මණ්ඩලය මඟින් 1948 දී වී සඳහා සහතික මිල ක්‍රමයක් හඳුන්වා දුන් අතර 1972 වී අලෙවි මණ්ඩලය මඟින් එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලදී.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම**

සහතික මිල ක්‍රමයෙන් වී ගොවියාට සැලසෙන වාසි පිළිබඳ රචනාවක් ලියන්න.

නව වී වර්ග හඳුන්වා දීම සඳහා 1952 දී බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය පිහිටු විය. ඉන් අනතුරු ව ලබුදූව - මහඉලුක්පල්ලම, බෝඹුවල, හිඟුරක්ගොඩ යනාදි ප්‍රදේශවල වී පර්යේෂණ ආයතනයන් පිහිටුවනු ලැබිණි.

## ණය පහසුකම් ලබාදීම

- වී ගොවියාගේ දරිද්‍රතාව මැඩ පැවැත්වීමට පියවර රාශියක් ගැනිණි. ඒ අනුව ඉඩම් කොමසාරිස් දෙපාර්මේන්තුව, ආහාර දෙපාර්මේන්තුව, ගොවිජන සේවා දෙපාර්මේන්තුව ආදිය මඟින් ණය ආධාර සැපයීම සිදු විය.
- 1961 මහජන බැංකුව පිහිටු වීමත් සමඟ සමුපකාර සමිති, අනුමත සමිති හා පුද්ගලයන්ට වී වගාව සඳහා ණය ආධාර ලබා දුනි.
- ලංකා බැංකුව විසින් 1972 සිට ගොවිජන සේවා මධ්‍යස්ථානවල පිහිටු වූ එම බැංකුවේ ශාඛා මගින් ද ණය ආධාර සපයනු ලැබිණි.
- ගොවි කටයුතු වඩාත් සාර්ථක ව පවත්වා ගෙන යාමට 1972 දී කෘෂිකාර්මික හා පර්යේෂණ ආයතනය ආරම්භ කරනු ලැබී ය.

# මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය

නිදහස ලැබීමෙන් පසු බලයට පත් වූ ආණ්ඩු මේ රටේ වී ගොවිතැන ප්‍රධාන කොට ගත් යැපුම් කෘෂිකර්මය නගා සිටුවීම සඳහා ආරම්භ කළ වැදගත් ම ව්‍යාපෘතිය වූයේ මහවැලි යෝජනා ක්‍රමය යි. එය ආරම්භ කිරීමට පෙර අවස්ථා කිහිපයක දී ම ශක්‍යතා අධ්‍යයන කටයුතු සිදු කරනු ලැබී ය.

ඩී. එස්. සේනානායක මහතාගෙන් පසු අගමැති තනතුරට පත් වූ ඩඩ්ලි සේනානායක මහතාගේ පාලන කාලයේ දී රන්දෙනිගල යෝජනා ක්‍රමය පිළිබඳ මූලික අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී.

කෘෂිකර්ම ඇමති බුලංකුලම මහතා යටතේ (1953 - 56) කාලයේ දී මහවැලි නිම්නයේ ඉඩම් හා ජනගහනය පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීය. 1958 ඇමරිකානු රාජ්‍ය ආයතනයක් ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි මහවැලි ජලය බහුකාර්ය කටයුතු සඳහා යොදා ගැනීමට සැලසුම් සකස් කෙළේ ය. 1961 සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ පාලන සමයේ දී, සවිස්තර අධ්‍යයන සැලැස්ම අනුව මහා සැලැස්ම සකස් කෙළේ ය. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට ප්‍රථම පියවරක් වශයෙන් 1970 දී මහවැලි ගඟ හරහා වේල්ලක් බැඳ පොල්ගොල්ල ව්‍යාපාරය ආරම්භ කළ හැකි විය.

මුල දී තිස් වසරකින් නිම කිරීමට බලාපොරොත්තු වූ මහවැලි යෝජනා ක්‍රමය සය වසරකින් නිම කිරීමට 1977 බලයට පත් ජේ.ආර්. ජයවර්ධන මහතාගේ උපදෙස් ලැබීම හා ඒ අනුව ක්‍රියාත්මක වීම සිදු විය. මහවැලි යෝජනා ක්‍රමය යටතේ වික්ටෝරියා, රන්දෙණිගල, රන්ටැඹේ හා කොත්මලේ යනාදී විශාල ජලාශ යෝජනා ක්‍රම ඇරඹුණු අතර කෘෂිකාර්මික සංවර්ධන ප්‍රදේශ රාශියක් ම බිහි විය.

වී වගාවට අමතර ව වෙනත් බෝග වගාව සඳහා ද රජයේ අවධානය යොමු වූ අතර ඒ සඳහා පියවර රාශියක් ගෙන ඇත. 1948 නිදහසින් පසු උස් බිම් හා අතරමැදි කලාප අමතර බෝග වගාව සඳහා යෙදවීය. 1960 දශකයේ අග භාගයේ පැනවූ ආනයන සීමා පනත් හේතු කොට ගෙන අමතර බෝග වගාව දියුණු විය. (1970 -77) කාලයේ ක්‍රියාත්මක කළ ආනයන පාලනය හේතු කොට ගෙන අමතර බෝග නිෂ්පාදනය ශීඝ්‍රයෙන් වර්ධනය වීය. උතුරු, මධ්‍යම සහ ඌව යන පළාත්වල අර්තාපල් වගාව දියුණු වීම උදාහරණයක් ලෙස දැක්විය හැකි ය.

## සුළු අපනයන බෝග වගාව දියුණු කිරීම

- සාම්ප්‍රදායික බෝග තුළින් ලැබෙන ආදායම් ප්‍රමාණවත් නොවීම නිසා සුළු අපනයන බෝග වන කෝපි, කොකෝවා, කරදමුංගු, සාදික්කා, ගම්මිරිස්, සින්කෝනා, පැඟිරි වර්ග යනදිය වගා කිරීම් කෙරෙහි රජයේ අවධානය යොමු විය. ඒ අනුව බෝග විවිධාංගිකරණය සාර්ථක කොට ගැනීම සඳහා විවිධ පියවර ගනු ලැබී ය.
- 1968 තේ කොමිෂන් වාර්තාව අනුව විශේෂයෙන් ආර්ථික වශයෙන් ලාභදායි නොවන තේ ඉඩම්වල විකල්පයක් ලෙස කෝපි, කොකෝවා, කුරුඳු, ගම්මිරිස්, සාදික්කා වැනි බෝග වැවීමට නිර්දේශ කෙරිණි.
- 1972 මැදරට ඇරඹි බෝග විවිධාංගිකරණ ව්‍යාපෘතිය සඳහා ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් මූල්‍යාධාර සපයා දෙන ලදී.
- 1972 සුළු අපනයන බෝග ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇති ව සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව පිහිටවනු ලැබිණි. 1972 මාතලේ සුළු අපනයන බෝග පර්යේෂණ ආයතනයක් ආරම්භ කෙළේ ය. අනතුරු ව සුළු අපනයන බෝග නිෂ්පාදනය හා වගා ක්‍රම ආශ්‍රිත පර්යේෂණ කිරීමට (කුණ්ඩසාලය, දැල් පිටිය, නිල්ලඹේ, මාපලාන, ගම්මඩුව, නාරම්මල) යන ස්ථානවල පර්යේෂණායතන 6ක් පිහිටු විය.
- 1972 සහන යෝජනා ක්‍රම මගින් සුළු අපනයන බෝග වගා බිම් වැඩි කිරීමටත් නිෂ්පාදන දිරිමත් කිරීමටත් පියවර ගනු ලැබී ය. ආරක්ෂිත මිල-පොහොර ආධාර හා උපදෙස් ලබා දීම වැනි රාජ්‍ය අනුග්‍රහයන් මඟින් අපනයනයට සුදුසු බෝග වගා කිරීමට පියවර ගැනිණි. 1972 - 76 පස් අවුරුදු සැලැස්ම තුළින් කපු, බඩ ඉරිඟු සහ සූරියකාන්ත වැනි බෝග වැවීමට පියවර ගැනිණි.



රූපය 6.12 සුළු අපනයන බෝග

## ව්‍යාපාරික කෘෂිකර්මය

බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලංකාවේ දියුණු කළ වතු ව්‍යාපාරය මඟින් අද දක්වා ම විශාල විනිමය ප්‍රමාණයක් ඉපයීමත් රැකියා රාශියක් සැපයිමත් සිදු වේ. මෑතක් වන තුරු ශ්‍රී ලංකාවේ විදේශ විනිමය වැඩි ම ප්‍රමාණයක් ලබා දුන්නේ ද මෙම වතු නිෂ්පාදනයි. වතු වගා කළ ඉඩම් වැඩි ප්‍රමාණය විදේශීය සමාගම් සතු ව පැවති අතර ඒවායින් විශාල ආදායම් උපයා ගනු ලැබුවේ ද විදේශිකයන් විසිනි.

## නිදහසින් පසු ශ්‍රී ලංකාවේ වතු වගාව සම්බන්ධව ඇතිවූ නව ප්‍රවණතා

- 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය මගින් පෞද්ගලික ඉඩම් අයිතියේ උපරිමයක් නියම කෙරිණි. ඒ අනුව එක් පුද්ගලයකුට උපරිම වශයෙන් වී වගාව සඳහා හෙක්ටයාර් 10 (අක්කර 25)ක් ද වෙනත් වගා සඳහා හෙක්ටයාර් 20 (අක්කර 50) ක් ද අයිති කොට ගත හැකි විය. ඒ අනුව එතෙක් පැවති අක්කර දහස් ගණන් වූ විශාල වතුයාය  පවත්වාගෙන යාම එම නීතිය මගින් අහෝසි විය.
- 1972 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටු වූ අතර ඉහත දක්වන ලද සීමාවන්ට අනුකූල නො වූ ඉඩම් සියල්ල අත්පත් කොට ගැනීමේ සහ නැවත ඒවා බෙදා හැරීමේ කටයුතු එම කොමිෂන් සභාවට පැවරිණි. 1972 -75 යන වර්ෂවල දී ක්‍රියාත්මක කරන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ හේතුවෙන් පුද්ගලික සමාගම් සතු ව තිබූ

  තේ ඉඩම් හෙක්ටයාර් 166405 ද

  රබර් ඉඩම් හෙක්ටයාර් 74494

  පොල් ඉඩම් හෙක්ටයාර් 48130

  ජනසතු කරන ලදී.
- 1975 අංක 30 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධනය) නීතිය මගින් ඉඩම් ප්‍රතිසංස්කරණයේ විෂය පථය තවදුරටත් පුළුල් කෙරිණි. එම නීති මඟින් ව්‍යාපාරික වතු වගාවේ නියැලුණු පොදු සමාගම් සතු ඉඩම් හා ඉඩම්වලට සම්බන්ධ ප්‍රාග්ධන වත්කම් සියල්ල ම ද ජන සතු කරන ලදී.
- මෙම ප්‍රතිසංස්කරණ හේතු කොට ගෙන 1976 වන විට මහා පරිමාණ වතුවලින් සමන්විත වූ වතු වගාව යටතේ පැවති ඉඩම්වලින්  62%කට ආසන්න ප්‍රමාණයක් රාජ්‍ය අංශයේ අයිතියට පත් විය. එසේ රජය විසින් අත් පත් කොට ගත් ඉඩම්වලින්

28%ක් රාජ්‍ය අනුග්‍රහය ලබන සමුපකාර ගොවිපොළවල් ඉදිකිරීමට බදු දීම ද 10% ක් කුඩා බිම් කොටස් ලෙස ගොවීන් අතර බෙදා දීම ද සිදු විය.

- වතු කළමනාකරණ කටයුතුවලින් නියෝජිත ආයතන ඇතුළු පොදු සමාගම් ඉවත් වීම ද එම කාර්යයන් රාජ්‍ය අංශයේ ආයතනවලට පවරා දීම ද සිදු විය. ඉඩම් පිළිබඳ අයිතිය පෞද්ගලික අංශයෙන් රාජ්‍ය අංශයට මාරු විය. එපරිද්දෙන් නිදහසින් පසු ව මේ රටේ සිදු වූ එක්තරා විප්ලවකාරි සංවර්ධන ක්‍රියාවලියක් ලෙස මෙම ඉඩම් ප්‍රතිසංස්කරණය හැඳින්විය හැකි ය.

  රජයට පවරා ගත් ඉඩම් කළමනාකරණය කිරීම සඳහා ප්‍රධාන ආයතන තුනක් පිහිටුවන ලදී.

  1958 පිහිටු වූ රාජ්‍ය වැවිලි සංස්ථාව,

  1976 උඩරට වතු සංවර්ධන මණ්ඩලය,

  1976 ජනතා වතු සංවර්ධන මණ්ඩලය එම ආයතන වේ.

  මෙලෙස 1976 වන විට ව්‍යාපාරික බෝග වගා කර තිබූ බිම් ප්‍රමාණයෙන් 35%ක් මෙරට රාජ්‍ය ආයතන මගින් පාලනය විය. නිදහසින් පසු තේ, පොල්, රබර්, නිෂ්පාදන ක්‍රමයෙන් ඉහළ ගිය අතර අපනයන වැඩිවීම ද කැපී පෙනිණි. ලෝක වෙළෙඳපොළේ මුළු තේ නිෂ්පාදනයෙන් 1950 දී 34%ක් ද 1960 දී 40%ක් ද සපයන ලද්දේ ශ්‍රී ලංකාව විසිනි.

## රබර්

ශ්‍රී ලංකාවේ ඇරයුම අනුව 1952 දී මහජන චීන සමූහ ආණ්ඩුව සමඟ ඇති කොට ගත් ද්විපාර්ශ්වික ගිවිසුම හේතු කොට ගෙන ශ්‍රී ලංකාවේ රබර් නිෂ්පාදනය සඳහා ස්ථිර වෙළෙඳපොළක් ලබා ගැනීමට හැකි විය. 1977 දී ස්වාභාවික රබර් සඳහා වූ ජාත්‍යන්තර ගිවිසුම අත්සන් කිරීම නිසා ද ශ්‍රී ලංකාවට වාසි අත් විය. 1977 සිට දේශීය හා ලෝක බැංකු ආධාර ඇති ව රබර් නැවත වගා කිරීමට හා අලුත් වගාවන් සඳහා සහනාධාර ලැබිණි.